# 3

# පසුබෑමට ලක්ව ඇති ප්‍රදේශ සංවර්ධනය සහ දිළිඳු හිතකාමී, වර්ධන හිතකාමී මූලාරම්භක පියවර



## පසුබෑමට ලක්ව ඇති ප්‍රදේශ සංවර්ධනය

# පසුබෑමට ලක්ව ඇති ප්‍රදේශ සංවර්ධනය

වැඩි දියුණු කල ආර්ථික ක්‍රියාදාමන් තුලින් අත් වූ ප්‍රතිලාභ සමානුපාතිකව බෙදා හැරීමේ අවශ්‍යතාව සහතික වීම, "දස අවුරුදු ඉදිරි දැක්ම 2006 – 2016 සංවර්ධන කාර්යය රාමුව" නම් වූ රජයේ මධ්‍යකාලීන සංවර්ධන වැඩසටහන තුල අවධානයට ලක් වූ එක් ප්‍රධාන කරුණකි.

අතීතයේ දී, අරගලකාරී තත්ත්වයෙන් අලාභහානි වූ හුදෙක් උතුරු නැගෙනහිර ප්‍රදේශ සංවර්ධන කිරීමෙහි ලා විශේෂයෙන් අවධාරනය කර ඇත. පවතින ගැටුම්කාරී තත්ත්වයේ බලපෑම හුදෙක් සම්පත් අපතේ යෑම හා දිළිඳුභාවය වැඩිවීමේ ප්‍රවණතාවය මඟින් නිරූපනය වේ. ජන පිරිස් අවතැන්වීමෙන් හා සමාජ හා ආර්ථික යටිතල පහසුකම් බිඳවැටීම හේතුවෙන් ගැටුම්කාරී තත්ත්වයට පෙර ජාතික නිෂ්පාදනය සඳහා 14% පැවති දායකත්වය ඉන්පසුව 8% දක්වා අඩු වී ඇත. එබැවින් මෙම ප්‍රදේශ සංවර්ධනය කිරීමෙහි ලා විශේෂයෙන් අවධාරණය කිරීමේ අවශ්‍යතාවය එළඹී ඇත.

2004 දෙසැම්බර් මාසයේ දී ඇති වූ සුනාමි ව්‍යසනයේ අවාසනාවන්ත අත්දැකීම් හේතුකොට ගෙන, මෙරට මුහුදු තීරයේ විශාල ප්‍රදේශයක් හානියට පත් වූ අතර අනපේක්ෂිත අයුරින් සමාජ හා ආර්ථික යටිතල පහසුකම් බිඳ වැටින. අලාභහානි වූ සමස්ථ මුහුදු තීරය ප්‍රසංස්කරණය කිරීම හා පුනරුත්ථතාපනය කිරීමෙහිලා රජයට ක්ෂණික අවධානය යොමු කිරීමට සිදුවිය. ගැටුම්කාරී තත්ත්වයෙන් අලාභහානි වූ ප්‍රදේශවලට අමතරව, හම්බන්තොට, මාතර හා ගාල්ල ප්‍රදේශවල පශ්චාත් සුනාමි පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය කෙරෙහි රජයට විශේෂ අවධානය යොමු කිරීමට සිදුවිය.

කෙසේ වෙතත් පවතින ගැටුම්කාරී තත්ත්වයෙන් හෝ සුනාමි ව්‍යාසනයෙන් හෝ සෘජුවම හානියට පත් නොවූ එහෙත් ජනපද පිහිටුවීමේ අවධියේ සිට අන්ත දිළිඳු භාවයෙන් පෙළෙන වතුකරය ඇතුලත් බදුල්ල, මොණරාගල, රත්නපුරය, කෑගල්ල, යනආදී මධ්‍යම පළාතේ දිස්ත්‍රික්ක කාණ්ඩයක් ඇත. ආර්ථික නිමැවුමෙහිලා වතු අංශය දැවැන්ත දායකත්වය ලබාදුන්න ද, එම ක්‍රියාමර්ගයන්ගෙන් මෙම ප්‍රදේශවල වෙසෙන වැඩි පිරිසගේ ජීවන මට්ටමෙහි සැළකියයුතු වර්ධනයක් ඇති වි නොමැත. එමනිසා, ගැටුම්කාරී තත්ත්වයෙන් මෙන්ම සුනාමියෙන් හානියට පත් සහ ආර්ථික අතින් නොදියුණු ප්‍රදේශවලින් සමන්විත "පසුබෑමට ලක් ව ඇති ප්‍රදේශ" වශයෙන් වර්ගීකරණය කලහැකි මෙම ප්‍රදේශ සංවර්ධන කිරීමෙහිලා විශේෂ අවධානය යොමු කිරීමෙහි අවශ්‍යතාවය, "දස අවුරුදු ඉදිරි සංවර්ධන කාර්යය රාමුව 2006 – 2016" වැඩසටහන තුල හඳුනාගෙන ඇත. මෙම ප්‍රදේශවල ආර්ථික කටයුතු වැඩි දියුණු කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති හඳුනාගෙන ඇති අතර, මාර්ග, ජලසම්පාදන හා විදුලිබලය වැනි පවතින යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීම කෙරෙහි ද අවධානය යොමු වි ඇත.

මෙකී ව්‍යාපෘති වලින් ඉලක්කගත වර්ධනයන්ට අමතරව, සමස්ථ ආර්ථිකයට දායකත්වය ලබා දෙන විදුලිබල ජනනය, ගුවන් තොටුපල හා මුහුදු වරායන් වැනි දැවැන්ත යටිතල පහසුකම් හා ආශ්‍රිත ව්‍යාපෘති ද ක්‍රියාත්මක වේ.

# උතුරු නැගෙනහිර ප්‍රජා ආරක්ෂණ හා සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව, ජර්මන් රජය, ඔපෙක් අරමුදල, ෆින්ලන්ත රජය සහ නෙදර්ලන්ත රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතිය 2007 ජුනි 30 වන දින අවසන් වූ අතර ඇ.ඩො. මිලියන 40 ක ණය මුදලකින් 98% උපයෝජනය කරන ලදී. කෘෂිකර්මාන්තය, සෞඛ්‍යය, අධ්‍යාපනය හා නිපුණතා පුහුණුව, මාර්ග හා පාලම්, මිරිදිය කර්මාන්ත, වාරි කර්මාන්ත, සමාජ සංවර්ධන, ජල සම්පාදනය හා සනීපාරක්ෂාව වැනි ක්ෂේත්‍ර ඔස්සේ උප ව්‍යාපෘතීන් 596 ක් ක්‍රියාත්මක කර ඇත. ආසන්න වශයෙන් 898,244 ක ජනකායක් මෙමගින් ප්‍රතිලාභ ලැබීය.



කිලිනොච්චි ජාතික රෝහල

උතුරු නැගෙනහිර පලාත් වල ක්‍රියාත්මක වන පුනරුත්ථාපන හා සහන කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව ඇ.ඩො. මිලියන 10 ක් 2004 වසරේදී හා ඇ.ඩො. මිලියන 40 ක් (ඇ.ඩො. මිලියන 26 ක ණය හා ඇ.ඩො. මිලියන 14 ක ප්‍රදාන) 2005 වසරේදී NECORD - දීර්ඝ හා NECORD - II ව්‍යාපෘති වලට ලබා දෙන ලදී.

2007 සැප්තැම්බර් 31 වන දිනට NECORD - දීර්ඝ හා NECORD - II ව්‍යාපෘති මගින් වියදම් කර ඇති මුදල පිළිවෙලින් රු. මිලියන 540.95 හා 1722.96 ක් වේ. මෙම ව්‍යාපෘතීන් දෙකම 2009 ජුනි 30 වන දින අවසන් වීමට නියමිත වේ.



නැවත ඉදිකල කෘෂිකර්ම පුහුණු-
ආයතනයේ නේවාසිකාගාරය, වවුනියාව



නැවත ඉදිකල බාතියාගම විද්‍යාලය
කන්තලේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

## යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය

2004 මාර්තු මාසයේදී මෙම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කළ අතර එය 2008 ජූනි මස 30 වන දින අවසන් වීමට නියමිතය. ආසියානු සංවර්ධන බැංකුව මේ සඳහා ඇ.ඩො. මිලියන 80 ක ණයක් ලබාදෙන ලදී. මෙම මුළු ණය මුදලින් ඇ.ඩො. මිලියන 23.9 ක් උතුරු - නැගෙනහිර පළාත්වල වෙසෙන යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රජාව නඟාසිටුවීම හා සංවර්ධනය සඳහා ලබාදෙන ලදී. 2007 සැප්තැම්බර් 30 වන දින වනවිට මේ හරහා වියදම් කර ඇති මුළු මුදල රු. මිලියන 1609.74



ප්‍රතිසංස්කරණය කරන ලද සිංහල ම. වි. ත්‍රිකුණාමලය

## ප්‍රජා සංවර්ධනය හා ජීවනෝපාය මාර්ග වැඩිදියුණු කිරීමේ ගැමිදිරිය ව්‍යාපෘතිය

ජනතාව විසින් මෙහෙයවනු ලබන ප්‍රජාපාලිත සංවර්ධන ප්‍රවේශයක් යොදාගන්නා ගැමිදිරිය ව්‍යාපෘතිය රජයේ දිළිඳුකම තුරන් කිරීමේ උපාය මාර්ගයට සහාය දෙයි. මෙම ව්‍යාපෘතිය බදුල්ල, මොණරාගල, ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුර, පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල ග්‍රාමීය දිළිඳු ජන කොටස් අතර ආදායම් උපයාගැනීමේ ක්‍රියාවන්, ඉතුරුම් සහ සුළු ආයෝජන ප්‍රවර්ධනය ආදියට පහසුකම් සැළසීම මඟින් ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය හා ජීවන තත්වය වැඩිදියුණු කිරීම සිදුකරනු ලැබේ.

ලෝක බැංකුව මඟින් සපයා දෙනු ලැබූ ඇ.එ.ජ.ඩො.මි. 51 ක ප්‍රදානයක් මඟින් ගැමිදිරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. අවුරුදු තුනක කාලයක් ඇතුලත මෙමඟින් දිළිඳු ගම්මාන 836 ක් ආවරණය කර ඇති අතර පවුල් 150,00 කට පහසුකම් සළසා ඇත. මේ වන විට එම පවුල්වල ඉතුරුම් රු.මි. 83 ක් දක්වා ඉහළ ගොස් ඇත.

එම ඉතුරුම් ගැමිදිරිය ගම්මාන වල ආදායම් ඉපයීමේ කටයුතු සඳහා රු.මි. 422 දක්වා ප්‍රතිආයෝජනය කර ඇත. තව ද රු. මි. 33 ක් වූ පොලී ආදායමක් ඉපයීමට ද 98% ක් වූ ඉහළ ණය ආපසු ගෙවීමේ අනුපාතයක් ද පවත්වා ගෙන යනු ලැබේ.





ගැමිදිරිය ජනකොට්ඨාශ වෙත ගැමිදිරිය පදනම මඟින් මූලික පහසුකම් සළසා දෙන අතර එම ජනකොට්ඨාශ ඔවුන්ගේ ගමේ මූලික අවශ්‍යතා ඔවුන් විසින්ම තීරණය කර/ කරගෙන මාර්ග, කුඩා පාලම්, සපත්තු පාලම්, පානීය ජල ව්‍යාපෘති, සුළු වාරි මාර්ග ව්‍යාපෘති, හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති සඳහා මුදල් යොදවා ඇත.මෙම යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිවල ගැමිදිරිය සාමාජිකයන්ගේ මුදල් හා ශ්‍රම දායකත්වය ඉහළ අගයක් ගෙන ඇති බැවින් එමඟින් ඉතිරි වන මුදල් ගමේ ඊළඟ මූලික අවශ්‍යතා වෙනුවෙන් යොදා ගැනීමට හැකියාව ලැබේ. (ගැමිදිරිය ව්‍යාපෘති ක්‍රියාකාරකම් හරහා තරුණ හා වැඩිහිටි ප්‍රජා වෘත්තිකයන් 500 දෙනෙකු පමණ මේ වන විට බිහි වී ඇත. ඔවුන් මනා ලෙස පුහුණු කරවනු ලැබ ඇති අතර ව්‍යාපයති කටයුතු අනෙකුත් ගම්මාන වලට හඳුන්වා දීමේදී ඔවුන් ඉමහත් සේවාවක් ඉටු කරයි.)

තව ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 4ක සිදුකිරීමට නියමිත ගමනැඟුම නියමු ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුව තාක්ෂණික සේවා සැපයීම සඳහා ආධාර කිරීමට එකඟ වී ඇත. මේ යටතේ ගැමිදිරිය ප්‍රජා පාලිත සංවර්ධනයේ මූලික සිද්ධාන්ත සහ පරිචයන් යොදාගැනීම/ආදේශ කරගැනීම සම්බන්ධව ගම නැඟුම නිළධාරීන් හා අදාළ ගම්වල ප්‍රජාව පුහුණු කිරීම දැන් සිදුකෙරෙමින් පවතී. දිළිඳු ජනතාවට ස්වෝත්සාහයෙන් නැඟීසිටීම සඳහා සූදානම් කිරීමේදී අදාළ කරගනු ලබන මූලික සිද්ධාන්ත වන සහභාගීත්වය, විනිවිද භාවය, වගවීම, පිරිවැය බෙදාගැනීම ආදිය මෙහිදී යොදා ගැනේ.

## දිළිඳුකම දුරලීම අරමුණු කරගත් නැගෙනහිර යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජපාන රජය විසින් ආසන්න වශයෙන් ඇ. ඩො. මිලියන 39 ක ණය මුදලක් ලබා දී ඇත. ලබා දී ඇති අරමුදල් උපයෝගී කර ගනිමින් A 4 සහ A 15 මාර්ගයන්හි අක්කරෙයිපත්තුවේ සිට ත්‍රික්කණ්ඩිමඩු දක්වා වන කිලෝ මීටර් 98 ක මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ මඩකළපුව ප්‍රදේශයෙහි මීටර් 291 ක දිගකින් යුත් නව කල්ලඩි පාලම ඉදි කෙරෙන අතර එමගින් නැගෙනහිර ප්‍රදේශයේ ගමනාගමනය කාර්යක්ෂම වනු ඇත.

තවද, නැගෙනහිර ප්‍රදේශයේ වාසය කරන ජනතාවට ඉදිකිරීම් උපකරණ මෙහෙයවීම සහ නඩත්තුව පිළිබඳ පුහුණු පාඨමාලාවන් ඉදිකිරීම්, පුහුණු හා සංවර්ධන ආයතනය (ICTAD) විසින් නොමිලේ ලබා දෙනු ලබයි. මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු 2007 නොවැම්බර් මස වන විට ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

## දිළිඳුකම දුරලීම අරමුණු කරගත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

ආර්ථිකමය වශයෙන් පසුගාමී ප්‍රදේශ එනම් මොණරාගල, බදුල්ල, හම්බන්තොට සහ අම්පාර යන දිස්ත්‍රික්කයන්හි අයත් ජාතික මහාමාර්ග, පළාත්බද සහ ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය හෝ වැඩි දියුණු කිරීම සඳහා ඇ. ඩො. මිලියන 35 ක ණය ආධාරයක් ජපන් රජය විසින් ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ එකී දිස්ත්‍රික්කයන්හි දිගින් කිලෝ මීටර් 650 - 700 ක් පමණ වූ මාර්ග 145 - 150 කට ආසන්න ප්‍රමාණයක් වැඩි දියුණු කිරීමට හෝ ප්‍රතිසංස්කරණය කිරීමට බලාපොරොත්තු වේ. මෙම ව්‍යාපෘතිය රජයේ "මග නැගුම " වැඩ සටහනට සමගාමීව ක්‍රියාත්මක කෙරේ.

මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ජාතික මහා මාර්ගයන්හි වැඩ කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇති අතර, පළාත්බද සහ ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු 2007 ඔක්තෝම්බර් මස අවසානයේදී ආරම්භ කිරීමට නියමිතය.

මෙම ප්‍රදේශයන්හි මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩි දියුණු කිරීම තුලින් ප්‍රවේශ අවස්ථා ඉහළ මට්ටමකට පත් කිරීමට හැකියාව ලැබීම හේතුවෙන් එම ප්‍රදේශයන්හි ඇති කලාපීය අසමතුලිතතා දුරු කිරීමට ඉවහල් වේ.



තංගල්ල වීරකැටිය මාර්ගය

## දිළිඳුකම දුරලීම අරමුණු කරගත් ආර්ථිකය නංවාලීමේ හා ප්‍රජාව බලගැන්වීමේ ව්‍යාපෘතිය (PEACE)

ප්‍රාදේශීය කෘෂිකර්මාන්තයේ තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීමේ අපේක්ෂාවෙන් ගොවි ප්‍රජාවගේ සමාජ හා ආර්ථික තත්වය නංවාලීම සඳහා අවශ්‍ය වන්නා වූ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය, සහභාගිත්ව කළමනාකරණය, ජලය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීම සහ ණය හා අලෙවි පහසුකම් වැනි අනුබල ගැන්වීමේ සේවා වැඩි දියුණු කිරීම මෙන්ම කෘෂිකර්මාන්තයට අවශ්‍ය වැඩි දියුණු කළ යෙදවුම් සැපයීම තුලින් වඩාත් ලාභදායී කෘෂිකර්මාන්තයක් ඇති කිරීම හා කෘෂිකර්මාන්තයේ නියැලී සිටින ගොවීන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.



අනුරාධපුර, කුරුණෑගල, කිලිනොච්චි, මුලතිව්, වවුනියාව, මන්නාරම, අම්පාර, මඩකළපුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක මෙම ව්‍යාපෘතිය මගින් ආවරණය කෙරේ. මේ යටතේ ප්‍රධාන වාරි මාර්ග යෝජනා ක්‍රම 08ක්, මධ්‍යම යෝජනා ක්‍රම 12ක් හා කුඩා පරිමාණයේ වාරි මාර්ග යෝජනා ක්‍රම 80 ක යටිතල පහසුකම් හා ගොවි ජනපදයන්හි මාර්ග පුනරුත්තාපනය කිරීම සඳහාද, ප්‍රතිපාදන සලසා ඇත.

තවද, උතුරු නැගෙනහිර පළාත්වල හෙක්ටයාර 6,080 ක වාරි භූමි ප්‍රමාණයක් ආවරණය කෙරෙන ප්‍රධාන හා මධ්‍යම වාරි මාර්ග යෝජනා ක්‍රම 09 ක් මෙම ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය කෙරේ.



ගොවි සංවිධානවල පහසුකම් ඉහළ නැංවීම, කෘෂි කර්මාන්තය හා ආදායම් උත්පාදිත ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම හා කෘෂිකාර්මික සහන සේවා සවිමත් කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය මගින් ආධාර කෙරේ.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජපන් රජය ඇ. ඩො. මිලියන 52 ක ණය මුදලක් ලබා දී ඇති අතර ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2011 වසරේදී නිම කිරීමට අපේක්ෂා කෙරේ.

## දකුණු පළාතේ ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ ව්‍යාපෘතිය

පෞද්ගලික අංශයේ ආයෝජන කෘෂිකර්මාන්තයට සම්බන්ධ ව්‍යාපාර වල යෙදවීමට අනුබල දෙන අන්දමේ



මනම්පිට බංවැල්ගොඩැල්ල මාර්ගය අම්බලන්ගොඩ

ප්‍රා. ස. ප්‍රතිසංස්කරණයට පෙර

හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීමෙන් දකුණු පළාතේ ආර්ථික වර්ධනය වේගවත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. ආසියානු සංවර්ධන බැංකුව ඇ.ඩො. මිලියන 25ක ණය මුදලක් හා ඔපෙක් අරමුදල ඇ.ඩො. මිලියන 5 ක ණය මුදලක් මේ සඳහා ප්‍රදානය කර තිබේ.

මෙම ව්‍යාපෘතිය මගින් ව්‍යාපාර 4257 ක් සඳහා සහනදායි පදනම යටතේ ණය මුදල් සපයා දී ඇති අතර දකුණු පළාතේ ජනතාවට එම ව්‍යාපාර හරහා රැකියා අවස්ථා 11,646 ක් බිහි වී ඇත. ග්‍රාමීය මාර්ග වල තත්ත්වය වැඩි දියුණු කිරීමේ සංරචකයේ කටයුතු 75% අවසන් කර ඇති අතර ගංවතුරෙන් හානියට පත් වූ පාලම් වල ඉදිකිරීම කටයුතු සිදු කරමින්

පවතී. ව්‍යාපෘතියේ වැඩ කටයුතු වලින් 70% ක් පමණ අවසන් කර ඇත. 2008 ජූනි මස අවසානයේදී මෙම ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිතය.



අගුනුකොළපැලැස්ස වෙළඳපොළ




ප්‍රතිසංස්කරණයෙන් පසු

## උතුරු හා නැඟෙනහිර වෙරළබඩ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව විසින් උතුරු හා නැඟෙනහිර වෙරළබඩ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී ඇති මුදල ඇ.එ.ජ. ඩොලර් මිලියන 21 වේ. ව්‍යාපෘතියේ කාලසීමාව 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වන අතර ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර යන දිස්ත්‍රික්කයන්හි වෙරළබඩ ප්‍රදේශ වල ජීවත් වන ප්‍රජාවගේ මූලික අවශ්‍යතා සපුරමින් ඔවුන්ගේ දිළිඳු බව දුරලීම ව්‍යාපෘතියේ අරමුණ වේ.

වාලච්චේන හි පොඩවයිකට්ටු යන ස්ථානවල ධීවර වරායන් 02 ක් ඉදිකිරීම ව්‍යාපෘතිය යටතේ ඇති ප්‍රධාන ක්‍රියාකාරකමක් වන අතර ග්‍රාමීය පාරවල්, පෙර පාසල්, ක්‍රීඩාංගණ, ප්‍රජා ශාලා, පොදු වෙළඳපොල ගොඩනැගිලි, පොදු ළිං සහ අපවහන පද්ධති ඉදිකිරීම වැනි සුළු පරිමාණ ප්‍රජා යටිතල පහසුකම් ව්‍යාපෘතිය යටතේ ඇති කෙරෙමින් පවතී. දිළිඳු පවුල් වල ජීවනෝපාය සංවර්ධනය ඉලක්ක කරමින් ජාතික සංවර්ධන අරමුදල් භාරය මඟින් ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රමයක්ද ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

පරිසර ආරක්ෂණය සඳහා ව්‍යාපෘතිය යටතේ විශේෂිත ප්‍රදේශ කළමනාකරණ සැලසුම් 03 ක් ඉදිරිපත් කර ඇත. ඒ යටතේ ත්‍රිකුණාමල බොක්ක, මඩකලපුවේ කලපු ප්‍රදේශය සහ අම්පාර ජෛව විවිධත්ව ප්‍රදේශය තුල ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වැඩි දියුණු කල කලමනාකරණ ක්‍රම වේදයක් හඳුන්වා දීමට අපේක්ෂිතය.

මෙයට අමතරව සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සංරචක B යටතේ ඇ.එ.ජ. ඩොලර් මිලියන 22 ක් වෙන්කර ඇත.



ප්‍රජා මධ්‍යස්ථානය සහ පුස්ථකාලය - කරෙයිතිවු, අම්පාර

## යටිතල පහසුකම් සහ නිවාස සංවර්ධන ව්‍යාපෘතිය – පුත්තලම දිස්ත්‍රික්කය

පුත්තලම දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් සහ නිවාස සංවර්ධන ව්‍යාපෘතිය යුද්ධයෙන් පීඩාවට පත් නිවාස අහිමි වූ ජනතාව නැවත ඔවුන්ගේ මුල් ගම් බිම් වලට ආපසු යාමට කෙරෙන දිරිගැන්වීමේ එක් උපාය මාර්ගයකි. කල්පිටිය, මුන්දල, පුත්තලම හා වනාතවිල්ලුව කොට්ඨාශ වල පදිංචි අභ්‍යන්තරව අවතැන් වී සිටින පවුල් 20,600 කට නිවාස, පානීය ජලය, මහා මාර්ග හා සනීපාරක්ෂක පහසුකම් සැළසීම පිණිස මෙම ව්‍යාපෘතිය මූල්‍ය සම්පාදනය කෙරේ.




පොල් අතු සෙවිලි කල තාවකාලික නිවාස වෙනුවට අළුත් නිවාස 5653 ක් ඉදිකිරීම හා අඩක් නිමකල නිවාස 2232 ක් නිමකර අවසන් කිරීමට සහය වීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරේ. ව්‍යාපෘති ප්‍රතිලාභීන්ට වයඹ පළාතේ නාගරික මධ්‍යස්ථාන සමඟ සම්බන්ධතා පවත්වා ගත හැකි පරිදි පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රධාන මාර්ග හා සම්බන්ධ කෙරෙන කිලෝ මීටර් 100 ක මාර්ග ඉදිකිරීම මෙම ව්‍යාපෘතියේ තවත් එක් ප්‍රධාන කර්තව්‍යයකි. එකී මාර්ග ප්‍රාදේශීය සභා හා වයඹ පළාත් සභාවේ විෂය පථයට අයත් වනු ඇත.

ජාතික ජල සම්පාදන ජල ප්‍රවාහන මණ්ඩලයේ සහය ඇතිව ජල සම්පාදන ක්‍රම 34 ක් ග්‍රාම නිළධාරී කොට්ඨාශ 34 ක පිහිටුවා පවුල් 16875 කට පානීය ජලය සපයනු ලබන අතර එය භූගත ජලය භාවිතා කරමින් හෝ දැනටමත් ඇති ජලසම්පාදන ක්‍රම ව්‍යාප්ත කිරීම මඟින් සිදු කරනු ලබයි. සනීපාරක්ෂක පහසුකම් සැලසීම හා පාරිසරිකව ඇති විය හැකි හානි අවම කිරීම සඳහා මලාපවහන ජලය පවිත්‍ර කිරීම වැඩි දියුණු කළ හැකි පද්ධති මඟින් ජල ගැනීම් තර්ජනය පාලනය කිරීම මීට ඇතුළත් වෙයි.

දැනට සුභසාධක මධ්‍යස්ථාන 18 ක වෙසෙන ප්‍රතිලාභීන් 1425 දෙනෙකුට නිවාස කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පළමුවෙනි මුදල් වාරිකය ගෙවා ඇත. ජල ව්‍යාපෘති සහ අභ්‍යන්තර මාර්ග සඳහා වන මූලික ඉංජිනේරු සැළසුම් දැනට කරගෙන යනු ලැබේ.

## ග්‍රාමීය ආර්ථික සංවර්ධනයට පුනර්ජනන බලශක්තීන් යෙදවීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ලෝක බැංකුවෙන් ලබාගත් ඇමරිකානු ඩොලර් මිලියන 75 ක ණය මුදලකින් හා ලෝක බැංකුවේ 'ගෝලීය පාරිසරික පහසුකම්' යටතේ ලද ඇමරිකානු ඩොලර් මිලියන 8 ක ආධාර ප්‍රදානයක් මගින් ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රධාන විදුලිබල ජාලයෙන් පරිබාහිරව, පුනර්ජන බලශක්ති තාක්ෂණය යොදා ගැනීම මගින් ග්‍රාමීය ජීවන තත්ත්වය ගුණාත්මකව ඉහළ නැංවීමත්, දුෂ්කර ප්‍රදේශ වල වෙසෙන ප්‍රජාවට බලශක්ති සේවා සම්පාදනය කිරීමත්, පුනර්ජනනය කළ හැකි බලශක්ති සම්පත් අනුසාරයෙන් විදුලිබල ජාලය පාදක කරගත් බලශක්ති උත්පාදනය කිරීමෙහිලා පෞද්ගලික අංශයේ

සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමටත් බලාපොරොත්තුවේ.



**සූර්ය බලශක්තියෙන් ආලෝකය කරන ලද ජංගම කුටිය**

දැනට මෙම ව්‍යාපෘතිය මඟින් ජාතික විදුලි බල ජාලයට මෙගා වොට් 100 ක ධාරිතාවක් එක් කර ඇත. දැනට වැඩිමනත් වශයෙන් ගෘහස්ථ සූර්ය තාප බලශක්ති පද්ධති හා ප්‍රජා මූල කුඩා ජල විදුලි යෝජනා ක්‍රම මඟින් විදුලිබලය සපයනු ලැබූ ස්වාධීන කුඩා විදුලිබල සැපයුම් ජාල වැනි ජාතික විදුලිබල ජාලයෙන් පරිබාහිරව පුනර්ජනන බලශක්ති ප්‍රභව මඟින් ග්‍රාමීය නිවෙස් 100,000 කට අධික සංඛ්‍යාවකට මෙම ව්‍යාපෘතිය යටතේ විදුලිබලය සපයා ඇත. ඒ අනුව මේ වන විට ශ්‍රී ලංකාවේ ගෘහස්ථ වලින් 3% ක් පමණ මෙම ව්‍යාපෘතිය යටතේ විදුලිබලය සඳහා ප්‍රවේශත්වය ලබා ඇත.

මෙම ව්‍යාපෘතිය මගින් ග්‍රාමීය ප්‍රදේශ වල පුනර්ජනනය කළ හැකි බලශක්ති ප්‍රචලිත කිරීම සඳහා පෞද්ගලික ආයෝජන දිරිගැන්වීමෙන් ලබා ඇති සාර්ථක ප්‍රගතිය සහ ප්‍රධාන විදුලිබල ජාලය සම්බන්ධ බලශක්ති ව්‍යාපෘති වෙනුවෙන් පුද්ගලික අංශයේ දීර්ඝ කාලීන ආයෝජන සඳහා පවතින ඉල්ලුම සැළකිල්ලට ගනිමින්, ලෝක බැංකුව මඟින් මෙම ව්‍යාපෘතියට ඇමරිකානු ඩොලර් මිලියන 40ක අතිරේක ණය මුදලක් ලබා දීමට එකඟ වී ඇත.

මෙමගින් මෙගා වොට් 50ක ධාරිතාවයකින් යුත්, ප්‍රධාන විදුලිබල ජාලය හා සම්බන්ධිත විදුලි බලයක් උත්පාදනය කිරීමටත්, ගෘහස්ථ 60,000කට හා කුඩා හා මධ්‍යම පරිමාණයේ ග්‍රාමීය ව්‍යවසායයන් 500කට මෙන්ම රජයේ ආයතන වලටද සූර්ය තාප, ප්‍රජා ජල විදුලි හා ජෛවස්කන්ධ වැනි ප්‍රධාන විදුලිබල ජාලයෙන් පරිබාහිර විදුලි බල පද්ධති මගින් සෘජුවම විදුලිබලය ලබා දීමටත් හැකි වනු ඇත.

## දිළිඳු කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය



**ප්‍රතිසංස්කරණය කරන ලද ඉඳි මංඩිය වැව, වලස්මුල්ල**

මෙම ව්‍යාපෘතිය සිය අවධානය යොමු කර ඇත්තේ දිළිඳු බවින් වඩාත් පීඩිතව ඇති දකුණේ හම්බන්තොට සහ උතුරු හා නැගෙනහිර පළාත්වල කාන්තාවන් සවිබල ගැන්වීමයි. කාන්තා සංවර්ධන සම්මේලනය සහ සේවා ලංකා පදනම මඟින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. ග්‍රාමීය කාන්තාවන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමේ ලා ස්වෝත්සාහයෙන් කෙරෙන්නා වූ ජීවන තත්ත්ව වැඩි දියුණු කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය කුසලතා සහ ධාරිතාවය ඉහළ නැංවීමට මෙම ව්‍යාපෘතිය ඉවහල් වේ.

මෙයින් අපේක්ෂා කෙරෙනුයේ මෙම කාන්තාවන් ඔවුන්ගේ ආර්ථික, සමාජයීය හා මූල්‍යමය ගනුදෙනු සම්බන්ධයෙන් බලගැන්වීමය. මෙම ව්‍යාපෘතිය ජල රැස්කිරීමේ වැව් ඉදිකිරීම, කෘෂි ළිං ඉදිකිරීම, කුඩා වැව් පිළිසකර කිරීම සහ පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා දායක වේ.

## උතුරු නැගෙනහිර දෙවන වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ("යළි පිබිදෙමු" ව්‍යාපෘතිය)

උතුරු හා නැගෙනහිර පළාත් වල වෙසෙන ගැටුම් වලින් පීඩාවඩ පත් ප්‍රජාවගේ ආදායම් තත්ත්වය සහ එම ප්‍රදේශවල කෘෂිකර්මාන්තය හා අනිකුත් නිෂ්පාදන නගා සිටුවීමේ අරමුණින් ලෝක බැංකුව ඇ.ඩො.මි. 64.7 ක ණය මුදලක් උතුරු නැගෙනහිර දෙවන වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇත. මූලික වශයෙන් වාරිමාර්ග යෝජනා ක්‍රම 153 ක් සහ මාර්ග 227 ක් පුනුරුත්තාපනය කිරීම සහ ඒවා වැඩි දියුණු කිරීම මඟින් මෙය සිදු කෙරේ. එපමණක් නොව, ළිං 523 ක් හා විවිධ සේවා ගොඩනැගිලි 226 ක් ද මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකෙරේ. දැනට මෙම ව්‍යාපෘතිය මඟින් වාරිමාර්ග යෝජනා ක්‍රම 21 ක් පුනරුත්ථාපනය කිරීම හා ග්‍රාමීය මාර්ග 93 ක් ඉදිකිරීම නිමාවට පත් කර ඇත. තව ද, ත්‍රිකුණාමලයේ අල්ලායි, මඩකලපුව රුගම්, අම්පාරේ කරවාහු, මන්නාරමේ යෝධ වාරිමාර්ග යෝජනා ක්‍රමය සහ කිලිනොච්චියේ ඉරනමඩු වාරිමාර්ග යෝජනා ක්‍රම පුනරුත්ථාපන කටයුතු සඳහා හඳුනාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ කෘෂි ළිං 170 කට වැඩි ප්‍රමාණයක් දැනටමත් ඉදි කර ඇත.



රජ ඇළ, මුහුදු පැළෑටි ඉවත් කිරීම - අල්ලායි ව්‍යාප්ත කිරීමේ යෝජනා ක්‍රමය


විවිධ සේවා ගොඩනැගිල්ල කදිරවෙලි - මඩකලපුව

## උතුරු නැගෙනහිර නිවාස ප්‍රතිසංස්කරණ වැඩසටහන

උතුරු හා නැගෙනහිර පළාත්වල වෙසෙන ගැටුම් වලින් පීඩාවට පත් දිළිඳු පවුල්වල හානියට පත් නිවාස 34,784 ක් වැඩි දියුණු කිරීම හා ඒවා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා, ලෝක බැංකුව විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 75 ක ණය මුදලක් ලබා දී ඇත. මෙම වැඩසටහන මඟින් පළාත් දෙකෙහි පිහිටි අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, වව්නියාව, මන්නාරම, යාපනය, කිලිනොච්චි සහ මුලතිව් යන දිස්ත්‍රික්ක අටම ආවරණය කෙරේ. ව්‍යාපෘතියේ කටයුතු පුළුල් කිරීම සඳහා යුරෝපීය සංගමය විසින් ද යුරෝ මිලියන 5.88 ක ප්‍රදානයක් ලබා දී ඇත.

ප්‍රතිලාභීන්ට නව නිවාස ඉදිකිරීම සඳහා මූල්‍ය ආධාර සපයමින් නිවෙස් හිමිකරුවන් විසින්ම නිවාස ඉදිකිරීමේ ප්‍රවේශය තුළින් මෙම පීඩිත ජනතාව නැවත පදිංචි කරවීමේ රජයේ වෑයම, සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය කාර්මික සහාය ව්‍යාපෘතිය මඟින් සපයනු ලැබේ.

වර්ෂ 2010 වන විට නිවාස 34,784 ක වැඩ නිම කිරීමේ ඉලක්කය අතරින් දැනට නිවාස 11,364 ක් ප්‍රතිසංස්කරණය කර වැඩ නිම කොට ඇති අතර නිවාස 14,741 ක් ප්‍රතිසංස්කරණය කරමින් පවතී. පූර්ණ ලෙස හානියට පත් නිවසක් ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රු. 250,000/= ක මුදලක් ද අර්ධ ලෙස හානියට ලක් වූ නිවසක් වෙනුවෙන් රු. 100,000/= ක මුදලක් ද සපයනු ලැබේ.



තනා නිම කළ නිවසක් - මඩකලපුව

උතුරු නැගෙනහිර නිවාස ප්‍රතිසංස්කරණ වැඩසටහන මඟින් පෙදරේරුවන් හා වඩු කාර්මිකයන් වැනි නිපුනතා ඇති සේවකයන් වෙනුවෙන් අවශ්‍ය පුහුණුව ද සපයා ඇත. පෙදරේරුවන් 424 ක් සහ වඩු කාර්මිකයන් 290 දෙනෙක් දැනටමත් පුහුණුව අවසන් කර ඇති අතර, පෙදරේරුවන් 300 ක් හා වඩු කාර්මිකයන් 205 දෙනෙක් දිස්ත්‍රික්ක පහක ක්‍රියාත්මක වන පුහුණු වැඩසටහන් වල දැනට පුහුණුව ලබමින් සිටී.

## රාජ්‍ය නොවන අංශය සඳහා වු මධ්‍යස්ථානය

පසුගිය වසර කිහිපය තුළ පුනරුත්තාපන, ප්‍රතිසංස්කරණ හා සංවර්ධන ප්‍රයත්නයෙහි ලා හුදෙක්ම සුනාමියෙන් ප්‍රකෘති තත්ත්වයට ගෙන ඒම සඳහා රජය දැරූ ප්‍රයත්නයට රාජ්‍ය නොවන සංවිධාන මඟින් පිරිනමන ලද සුවිශේෂ දායකත්වය රජය ඉහලින් පිළිගෙන ඇත. මූලික සමාජ සේවා සැපයීම සහ අත්‍යාවශ්‍ය ප්‍රදේශයන්හි සංවර්ධන කටයුතු වලට දායක වීම රාජ්‍ය නොවන සංවිධාන මඟින් කෙරෙන සුවිශේෂී කාර්යභාරයන් වේ. බිම් මට්ටමේ ගැටළුවලට කාවැදීම නිසා දුෂ්කර ප්‍රදේශවලට මෙන්ම ඒවායේ ප්‍රජාවට රාජ්‍ය නොවන සංවිධාන දක්වන සහයෝගය තදින්ම හැඟී ඇත. සංවර්ධනය, සහභාගිත්වය අවධාරණය කිරීම, සමානාත්මතාවය, ස්ත්‍රී පුරුෂ සංවේදීතාවය මෙන්ම පාරිසරික තිරසාරතාවය කෙරෙහි ඔවුන් විකල්ප සැලසුම් හා ප්‍රවේශ හඳුන්වා දී ඇත.

රාජ්‍ය නොවන සංවිධාන, රටේ සංවර්ධනයේ හවුල්කරුවන් බවට පත් කිරීම උදෙසා එකී සංවිධානවල ක්‍රියාදාමයන් මැනවින් සම්බන්ධීකරණය කිරීම පහසු කිරීම මෙන්ම නවීකරණය කිරීම උදෙසා 2005 පෙබරවාරි මස විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ අංශය (CNGS) පිහිටුවන ලදි. ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (INGO) හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන (LNGO) වශයෙන් ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් හා යෝජනා ඇගයීමට ලක් කිරීම හා ඒවා ලියාපදිංචි කිරීම සඳහා සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම, තෝරා ගත් අංශ කිපයක INGO/ LNGO ක්‍රියාකාරකම්වල තොරතුරු රැස් කිරීම, ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධානවල මෙහෙයුම් නවීකරණය කිරීම අරභයා වාර්තා පවත්වා ගෙන යාම මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන් වේ.

දැනට ජාතික මට්ටමේ දේශීය රාජ්‍ය නොවන සංවිධාන වශයෙන් සංවිධාන 1210ක් ලියාපදිංචි වී ඇති අතර එයින් 8% ක සංඛ්‍යාවක් 2004 දෙසැම්බර් සුනාමි ව්‍යසනයට පසුව CNGS විසින් නිර්දේශ කොට ලියාපදිංචි වූ ඒවාය. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව 328ක් වන අතර එයින් 40% ක් සුනාමි ව්‍යසනයෙන් පසුව CNGS විසින් නිර්දේශ කොට ලියාපදිංචි කරන ලද සංවිධාන වේ. 2005 පෙබරවාරි මස රාජ්‍ය නොවන අංශය සඳහා වූ මධ්‍යස්ථානයේ ආරම්භයේ සිට මේ දක්වා සංවිධාන 132 ක් හා 96 ක් පිළිවෙලින් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන වශයෙන් ලියාපදිංචි වීම නිර්දේශ කර ඇත. තව ද මෙම ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍ර මුල්‍යන හා ආරක්ෂක කටයුතු සම්බන්ධව නිෂ්කාශනය කර ගැනීම සඳහා ඉල්ලීම් 136 ක් ඇගයීමට ලක් කොට විදේශ කටයුතු අමාත්‍යාංශය හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙතට යොමු කර ඇත. මෙම CNGS මධ්‍යස්ථානය මගින් නිවාස, අධ්‍යාපන, සෞඛ්‍ය, ධීවර, ජලය හා සනීපාරක්ෂාව, පාරිසරික හා ස්වභාවික සම්පත් මෙන්ම වෙනත් ජීවනෝපායි සංවර්ධන ක්‍රියාදාමයන්හි ලා ප්‍රධාන රාජ්‍ය නොවන සංවිධාන වෙතින් ලැබු ආධාර පිළිබඳ වරින් වර තොරතුරු රැස් කොට බෙදා හරින ලදි.

තවද මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය හරහා CNGS මධ්‍යස්ථානය විසින් රාජ්‍ය නොවන සංවිධාන වල සහභාගිත්වය හා මෙහෙයුම් රජයේ සංවර්ධන කාර්ය රාමුව තුළ ක්‍රියාත්මක වීම සඳහා විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදවනු ලබන අරමුදල් "මුදල් විශුද්ධීකරණය" සහ/ හෝ "ත්‍රස්තවාදී ක්‍රියා මුල්‍යනය කිරීම" සහ/ හෝ ජාතික අභිලාශයන් යටපත් කරන වෙනත් ක්‍රියාදාමයක් සමඟ හෝ සම්බන්ධ වී නොමැති බැව් සහතික වීම පිණිස අවශ්‍ය විධි විධාන යොදා ඇත. මාර්ගෝපදේශ නිකුත් කිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පහසු කරලීම හා සංවර්ධන/ සමාජ සේවා කටයුතු අධීක්ෂණය කිරීම පිළිබඳව මෙම සංවිධාන සමඟ භාණ්ඩාගාරයේදී රැස්වීම් ගණනාවක් පවත්වන ලදි.